# 2022 පෙබරවාරි මස 19 වන දින පැවති නව ආයෝජන, ආදායම් ප්‍රවර්ධන, ඉඩම් හා දේපල නිරවුල් කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව

**සහභාගිත්වය**

| | | | |
|---|---|---|---|
| 1. | නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති |
| 2. | නීතිඥ රංජිත් රාජකරුණා මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 3. | නලින් සිරිවර්ධන මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 4. | නීතිඥ නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 5. | කේ.ඒ.ඉන්ද්‍රාණි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 6. | ජයනි රාජකරුණා මිය | - | නාගරික ගණකාධිකාරි |
| 7. | කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා | - | නාගරික ඉංජිනේරු |
| 8. | එන්.පී.කේ.රණසිංහ මිය | - | පරිපාලන නිලධාරි |
| 9. | ඩී.එන්.ප්‍රියන්ති මිය | - | නීති නිලධාරි |
| 10. | එම්.ජී.සී.සනත් මහතා | - | ප්‍රධාන ආදායම් පරීක්ෂක |
| 11. | ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය | - | විෂය ලිපිකරු |

**නොපැමිණිම**

| | | | |
|---|---|---|---|
| 1. | ඩී.ජී.ප්‍රේමදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |

1. 2021 දෙසැම්බර් මස 16 වන දින පැවති මෙම කමිටුවේ අංක 09 යටතේ මහා රෝහල ඉදිරිපිට පවත්වා ගෙන යන රථගාලේ සීමාවන් නිශ්චය කර ලකුණු කරන ලද වාර්තාව ඉදිරිපත් කිරීම.
   මෙම සීමාවන්ට අදාලව පුවරු සකස් කර (චලනය කල හැකි පුවරු) සිටුවීමට තීරණය කරන ලදී. (වගකීම - නාගරික කොමසාරිස්)

2. නැගෙනහිර නුවරගම් පළාත, ප්‍රාදේශීය ලේකම්, ඊ.එම්.ආර්.පී.බී.ඒකනායක මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් අනුරාධපුර,අංක 248,1 පියවර 11 කොටස ග්‍රාම නිලධාරි තුලානේ අංක 25 ඒ දරණ පර්චස් 26.84 ක ඉඩම සඳහා දොන් ප්‍රේමසිරි ඇතුලත්මුදලි මහතා වෙත වාර්ෂික අවසර පත්‍රයක් ලබාදී ඇත. එකී අවසර පත්‍රය සහිත ඉඩම සඳහා දීර්ඝකාලීන බදුකරයක් ලබා දෙන ලෙස බදුකරු කර ඇති ඉල්ලීම පිළිබඳ සලකා බලා ඒකඟතාවය ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

ඇල රක්ෂිතයක හා යාබද අනවසර ඉඩමකට බලපත්‍ර ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම මෙම ඉඩම නාගරික කට්ටි සැළැස්මට ඇතුලත්ව නැත.මෙහි ඇල රක්ෂිතයට අවශ්‍ය ප්‍රමාණය නිර්නය කර ඉතිරි කොටසක් ඇත්නම් නගර සභාව සමග ගිවිසුම් ගතව බදු අයකිරිමට නිර්දේශ කිරිම. එබැවින් මෙම ඉඩමට දීර්ඝකාලින බදුකරය ලබාදීමේ එකඟතාව ලබාදිය නොහැකි බව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම්තුමා වෙත දන්වා යැවිමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි /නාගරික ඉංජිනේරු)

3. අනුරාධපුර,තිසාවැව,මිහිදුපුර,මිහිදු ගොවි සංවිධානයේ සභාපති විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මිහිදුපුර පන්සල මාර්ගයේ බෝගස පසුකර යන විට කුඹුරු යාය මැද වම් පැත්තට ඇති අනුරාධපුර මහා නගර සභාවට අයත් ඉඩම් කැබැල්ලෙන් පර්චස් 40 ක් පමණ ප්‍රමාණයක් මිහිදු ගොවි සංවිධානය සඳහා වෙන් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.
මෙම භූමිය වෙරිස් ආයතනය සමග ආරවුලක් පැවතිමත් එම ඉඩම්වල එලදාව වාර්ෂිකව බදුදීමේ පදනම යටතේ බදුදීමේ කොන්දේසියට යටත්ව තිබිම හේතුවෙන් කමතක් සංවර්ධනය කිරිමේ ඉල්ලීමට ඉඩදිය නොහැකි බවට තීරණය විය. මෙම කමත ඉදිකිරිම සඳහා ශ්‍රී මහ බෝධි පාරේ සිට මිහිදුපුර දක්වා ඇති මාර්ගයේ වම්පස රජයේ ළිඳක් සහිත පැරණි කමත් ඉඩම භාවිතයට ගැනිම සුදුසු බවට යෝජනා කිරිමට තීරණය විය. (වගකිම - නාගරික කොමසාරිස්)

4. ජයන්ති මාවත කඩ 30 ඉදිරිපස භූමිය රථගාලක්,වෙන්දේසි පොලක්, උත්සව ශාලාවක් හා නවාතැන් කාමර සැපයිමේ ස්ථානයක් ලෙස සංවර්ධනය කිරිමට තීරණය විය.
දේපල ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගෙන එය ඉටු කිරිමට කීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි / නාගරික ඉංජිනේරු)

5. තිසාවැව ලේඛම් නිලනිවාස පිහිටා තිබු ඉඩමේ පොදු පහසුකම් මධ්‍යස්ථානයක් සහිත නවාතැන් ස්ථානයක් ලෙස සංවර්ධන කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි /නාගරික ඉංජිනේරු)

6. සිංහල අවුරුදු පොල පැවැත්විමට කටයුතු කිරිම. මෙය 2022.04.07 දින සිට 11 වන දින දක්වා මහජන ක්‍රීඩාංගනයේ පැවැත්විමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි / සැළසුම් අංශ ප්‍රධානි)

7. පොසොන් සැණකෙළිය හා වෙළඳ පොල පැවැත්වීම 2022.06.14 දින සිට 2022.06.19 දින දක්වා පැවැත්විමටත් 2018 වර්ෂයට පෙර ක්‍රියාත්මක වු ආකාරයට ක්‍රියාත්මක කිරිමටත් තීරණය විය. (වගකිම - නාගරික කොමසාරිස්තුමා /නාගරික ගණකාධිකාරි)

8. මාර්කට් පෙදෙස, නුවරවැව ඇල පාර,අභිනවාරාම පාර,ධර්මපාල මාවත හා වීරසේකරාරාම පාර ප්‍රදේශයේ පිහිටි නගරයේ ප්‍රධාන බිම්කට්ටි සැළැස්මට අයත් නොවූ ඉඩම් කට්ටි හා එම ප්‍රදේශයේ නගර සභාව සමග ගිවිසුම් ගතවූ ඉඩම් කට්ටි පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

9. i. සමාධි පිළිමය අසල රථගාල යාබදව පිහිටි කුට්ටම් පොකුණ රථ නැවැත්වීමේ ස්ථානය සමග ඒකාබද්ධ රථගාලක් ලෙස සලකා කටයුතු කිරිමටත්,

ii. කුට්ටම් පොකුණ පොදු වැසිකිළිය පිහිටි භූමියේ විවේක උද්‍යානයක් සහිතව රථගාලක් සංවර්ධනය කිරිම සුදුසු බවටත් තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි/ නාගරික ඉංජිනේරු)

10. වෙළඳාමේ අවසරය ලබාදිම හා අදාල ගාස්තු අයකිරිම සඳහා සමාධි පිළිමය අසල නව වෙළඳ කුටි ලබාදි ඇති අයගේ තොරතුරු වාර්තාවක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගැනිමටත් දෛනිකව අයකිරීම් පිළිබඳව එක් වෙළඳ කුටියකට පිටුවක් බැගින් වෙන් කල ස්ථාවර ලේඛණයක් (පොතක්) නඩත්තු කිරිමටත් ඒ අනුව පෙර පරිදි පදික වෙළඳ ගාස්තු අයකිරිමටත් තීරණය විය. 2022 මාර්තු මස අයකිරීම් විස්තරය අප්‍රේල් මස කමිටුවට ඉදිරිපත් කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

11. නගරයේ වෙළඳාමේ යෙදෙන ජංගම වෙළඳ රථ,බයිසිකල් හා කරත්ත සංගනනය කිරිමටත් තීරණය විය. මෙම සංගනනය කිරිම ආදායම් අංශය සහ ඉංජිනේරු අංශය ඒකාබද්ධව සිදුකිරිමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

12. වකුගඩු රෝහල ඉදිරිපිට පවත්වා ගෙන යනු ලබන වෙළඳ කුටි සංගණන වාර්තාන අනුව හෙළිදරවු වූ වෙළඳ කුටි 13 සඳහා වාර්ෂිකව තාවකාලික ගිවිසුමකට ඇතුලත්විමටත් දෛනික රු.500.00 ක ගාස්තුවකට යටත්ව අයකිරිමටත්, සංගනන වාර්තාව අනුව වසා ඇති වෙළඳ කුටි ඉවත් කිරිමටත් තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි /නාගරික ඉංජිනේරු)

13. ජනසෙත අලෙවි පොල හා සැමදා කඩමණ්ඩිය තුල ඇති සියලු වෙළඳසැල් සඳහා එක් පිටුව බැගින් වනසේ සටහන් තැබිය හැකි ආදායම් ලේඛණයක් (පොතක්) නඩත්තු කිරිමටත් තීරණය විය. වෙළඳ පල ඉදිරිපිට හිස් වෙළඳ කුටිවල අංක සඳහන් කර දැන්විම් පල කිරිමටත් තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි / නාගරික ඉංජිනේරු)

14. සති පොලේ ගැටළු සඳහා විසඳුම් ලබාදීම.

I. පොලට පැමිණෙන සියලු වෙළෙඳුන්ට ස්ථානයක් වෙන්කරදීම තහවුරු විය යුතුය.

II. ඒ සඳහා විසඳුමක් ලෙස නිශ්චිත වර්ග ප්‍රමාණයක් වෙන් කල යුතුය. එහිදී එක් වෙළඳ කුටියක් සඳහා 6x6 වර්ග අඩි ප්‍රමාණයක් වියයුතුය. එම වෙළඳ කුටි අංක කළයුතුය. එහෙත් අල, ළූණු,කරවල,පොල් හා රෙදි සඳහා එම ප්‍රමාණයේ කුටි 02 බැගින් වෙන් කල යුතුය.

III. 6x6 ප්‍රමාණයේ වෙළඳ කුටියක් සඳහා ඒ ඒ වර්ගයේ වෙළඳ කුටිවලින් අයකල යුතු මුදල සඳහන් කරමින් ලදුපත් මුද්‍රණය කල යුතුය. එම ලදුපතේ වෙළඳ කුටියේ අංකය සඳහන් කිරිමට ඉඩක් තිබියයුතුය.

IV. එළවලු,පළතුරු,වලං සඳහා (6x6) වෙළඳ කුටියකට සතියකට රු.200.00 ක් අයකල යුතුය.

V. අල,ළූණු,කරවල,පොල්,තුනපහ,ප්ලාස්ටික් සඳහා වෙන් කල 6’x6’ වෙළඳ කුටි දෙකටම රු.500.00 බැගින් අයකල යුතුය.

VI. රෙදි සඳහා 6x6 වෙළඳ කුටි දෙකටම රු.300.00 අයකල යුතුය.

VII. මාළු සඳහා එක් වෙළඳ කුටියකට රු.1500.00 අයකල යුතුය.

VIII. පොලේ ගේට්ටු 04 සකස් කල යුතුය.

IX. මාළු වෙළඳ කුටි අසල ඉදිකර ඇති අපජල පිරිසිදු කිරිමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කලයුතුය. (වගකිම - නාගරික ගණකාධිකාරි/නාගරික ඉංජිනේරු)

15. මිරිසවැටිය අසල නව රථගාලක් ඉදිකිරිම සඳහා නගර සභාව ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ඉදිකල වැසිකිළිය කඩා දමා ඇත. එම වැසිකිළියේ වහල ෂීට් හා අබලි ද්‍රව්‍ය පිළිබඳව තොරතුරු ඇතුලත් වාර්තාවක් ලබා ගැනිමටත්, එම දේපල සභාව සතු කර ගැනිමටත්, අලුතෙන් ඉදිකරන වැසිකිළිය විකල්ප දේපලක් ලෙස සභාව සතු කර ගැනිමටත් තීරණය විය. (වගකිම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි /නාගරික ගණකාධිකාරි /නාගරික ඉංජිනේරු)

## මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා

- ගරු නාගරික මන්ත්‍රී සුරංගී ආර් සමරතුංග මැතිතුමිය විසින් ලිපියක් යොමු කරමින් සමෘද්ධි අමාත්‍යාංශය මගින් එක් කොට්ඨාශයකට HOME SHOP වෙන් කිරිමේදී 248 අභය පෙදෙස කොට්ඨාශයේ අනුරාධපුර,දූම්රිය නගරය,සේනානායක වී මෝල පාර,අංක:10/21 හි පදිංචි ප්‍රසංගා දිල්රුක්ෂි මහත්මිය තේරි ඇති අතර ඒ සඳහා සිංහ කණුව අසල සේනානායක වී මෝල පාර කඩ 05 න් එක් කඩයක් වෙන් කර දෙන ලෙස කර ඇති ඉල්ලිමට, කමිටුව විසින් අදාල කඩ අංක 17 (19)

ඉඩම් කොටස HOME SHOP සඳහා ලබාදීමට ඉල්ලුම්කාරිය සමග ගිවිසුම්ගත වීමට තීරණය විය. එම තීරණය අනුමැතියට යොමු කිරීමට.

- වකුගඩු රෝහල ඉදිරිපිට පවත්වා ගෙන යනු ලබන වෙළඳසැල් සංගණන වාර්තාව අනුව වාර්ෂික තාවකාලික ගිවිසුමකට අතුලත්වීමටත්, දෛනිකව රු.500.00 ක ගාස්තුවකට යටත් කර අයකිරීම් කිරීමටත් වසා ඇති වෙළඳසැල් ඉවත් කිරීමටත් කමිටු ගත් නිර්දේශ අනුමැතියට යොමු කිරීමට.

නීතිඥ ජේමසිරි හෙට්ටිආරච්චි,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,

නව ආයෝජන, ආදායම් ප්‍රවර්ධන,ඉඩම් හා දේපල නිරවුල් කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.